# තනතුරු - ඇබෑර්තු

## මාවතගම ප්‍රාදේශීය සභාව

මාවතගම ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති මාවතගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත සඳහන් කරුණු වලට අදාළ අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර සම්පූර්ණ කර ලේකම්, මාවතගම ප්‍රාදේශීය සභාව යන ලිපිනයට 2019.03.29 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| තනතුර | ශ්‍රේණිය | සේවක ගණය | පුරප්පාඩු ගණන | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01. පුස්තකාල උපස්ථායක | III | ප්‍රාථමික ශිල්පීය නොවන | 02 | රු. 24,250- 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 (3/2016- PL1) | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයන් දෙකකට සම්මාන සහිතව විෂයන් 06 ක් වත් සමත්ව තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) |
| 02. කාර්යාල කාර්ය සහායක | III | ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | රු.24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 (3/2016- PL1) | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයන් දෙකකට සම්මාන සහිතව විෂයන් 06 ක් වත් සමත්ව තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) |
| 03. මුරකරු | III | ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | රු. 24,250- 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 (3/2016 - PL1) | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) |
| 04. වැඩ ක්ෂේත්‍ර කම්කරු | III | ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | රු. 24,250- 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 (3/2016 - PL1) | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) |

*අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*

01. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවු. 18 නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය හෝ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.
02. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
03. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක් මාවතගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කළ ලියවිල්ලකින් සනාථ කළ යුතුය.
04. යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
05. මාවතගම ප්‍රාදේශීය සභාවේ ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/දීමනා පදනම මත සේවයේ නියුතු වූවන් කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ. (සතුටු දායක සේවා කාලයක් තිබූ බවට සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)
06. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙක් නොවිය යුතුය.



*බඳවා ගැනීමේ ක්‍රමය :*

අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් හා රියදුරු තනතුර සඳහා නිපුණතාවය පරීක්ෂා කිරීමේ ප්‍රායෝගික පරීක්ෂණයකින් අනතුරුව බඳවා ගැනීම් කරනු ලැබේ.

*සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :*

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.
02. රජයේ ප්‍රතිපත්තිවලට ද වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, වයඹ පළාත් සභාව විසින් වරින්වර පනවනු ලබන නීතිරීති හා නියෝගවලටද ආයතන සංග්‍රහය මුදල් රෙගුලාසි රජයේ වෙනත් රෙගුලාසි චක්‍රලේඛ උපදෙස්, දෙපාර්තමේන්තු නියෝග වලටද අනුකුලව ක්‍රියා කිරීමට බැඳී සිටිය යුතුය.
03. තෝරා ගනු ලබන අයදුම්කරුවන් අවු. 03 ක පරිවාස කාලයකට යටත් වේ. සේවය සතුටුදායක වීනම්, පළමු කාර්යක්ෂමතා කඩඉම සමත්ව ඇත්නම් ද, ලබා ගත යුතු භාෂා ප්‍රවීණතාවය ලබා ඇත්නම් ද පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.
04. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කර ගත් අයදුම්පත්‍රයක් 2019.03.29 හෝ එදිනට පෙර ලැබෙන සේ ලේකම්, ප්‍රාදේශීය සභාව, මාවතගම යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ.............................................. (තනතුරේ නම) තනතුර සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේදී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ පූර්ණ බලතල මාවතගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ. අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් ඉදිරිපත් කල යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේදී මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

1. උප්පැන්න සහතිකය
2. අධ්‍යාපන සහතික
3. පදිංචිය සනාථ කිරීමේ ලිපි
4. මෑතකදී ලබා ගත් ග්‍රාම සේවා සහතිකයක්
5. මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්
6. වෙනත් සුදුසුකම් හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතික

ඩබ්. ජී. නිශාන්ත කුමාර,<br>
ලේකම්,<br>
ප්‍රාදේශීය සභාව, මාවතගම.

### ආදර්ශ අයදුම්පත්‍රය

**මාවතගම ප්‍රාදේශීය සභාවේ.............................................. තනතුර සඳහා බඳවා ගැනීම - 2019**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

(අදාළ කොටුව තුළ ලියන්න)

1.0 අයදුම් කරන තනතුරු නාමය :

2.0 මුලකුරු සමග නම (මුලකුරු අගට යොදා මයා/මිය/මෙනවිය)
සිංහලෙන්/දෙමළෙන් :
ඉංග්‍රීසි කැපිටල් අකුරින්
(උදා :-PERERA A. B. C.)



2.1 සම්පූර්ණ නම :
සිංහලෙන්/දෙමළෙන් :
ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :

3.0 ජාතික හැඳුනුම්පත් අංකය :

4.0 ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ කොටුව තුළ යොදන්න)
පුරුෂ - M
ස්ත්‍රී - F

5.0 කාර්යාලීය ලිපිනය (පැහැදිලි අකුරින්)
සිංහලෙන්/දෙමළෙන් :
ඉංග්‍රීසි කැපිටල් අකුරින් :

5.1 පෞද්ගලික ලිපිනය
සිංහලෙන්/දෙමළෙන් :
ඉංග්‍රීසි කැපිටල් අකුරින් :

6.0 දුරකථන අංක : ස්ථාවර : ජංගම :

7.0 පදිංචිය :
7.1 පදිංචි දිස්ත්‍රික්කය :
7.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :

8.0 විවාහක/අවිවාහක බව :
අවිවාහක - 1 විවාහක - 2

9.0 උපන් දිනය
වර්ෂය මාසය දිනය

9.1 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට (2019.03.29 වැනි දිනට) වයස
අවුරුදු මාස දින

10. තනතුර :
10.1 දැනට දරන තනතුර :
10.2 ස්ථිර තනතුරට පත් වූ දිනය :

මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ.......................................... තනතුරෙහි සේවය කරන.............................. මහතාගේ/මහත්මියගේ/මෙනෙවියගේ වැඩ හැසිරීම සතුටුදායක වන බවත්, ඔහුට/ඇයට විරුද්ධ විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය :

03-344

Source: Government Gazette (2019.03.08)